# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2324/12 – 2023 මාර්තු මස 20 වැනි සඳුදා – 2023.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.බී. 21/78/(XV) (සී).**

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ, 21 වැනි වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) 2005 ජුනි මස 01 වැනි දින අංක 1395/15 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ උපලේඛනය (2017 අප්‍රේල් මස 19 වැනි දින අංක 2015/44 දරන *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ නිශ්චිතව දක්වා ඇති පරිදි) ඒ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''4. තාක්ෂණික අධ්‍යයන පීඨය'' යන අයිතමයට අනුරූපව උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ඊට අනුරූපී සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය සහ සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| ” I වන තීරය | II වන තීරය |
| --- | --- |
| 5. වෛද්‍ය පීඨය | 1. කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. භෞතවේද අධ්‍යයන අංශය |
| | 3. ජෛව රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. ව්‍යාධිවේද අධ්‍යයන අංශය |
| | 5. ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය |
| | 6. පරපෝෂවේද අධ්‍යයන අංශය |
| | 7. භිෂග්වේදය අධ්‍යයන අංශය |
| | 8. අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 9. මහජන සෞඛ්‍ය අධ්‍යයන අංශය |
| | 10. වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 11. ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 12. ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය |
| | 13. ළමා රෝග අධ්‍යයන අංශය |
| | 14. මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 15. පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 16. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය ” |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,**
අධ්‍යාපන අමාත්‍ය.

2023 මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 – 0270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.